# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2014

## Primary Piriven Mid Year Term Test - 2014

2 වසර / Grade 2

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**සිංහල**
**Sinhala**

කාලය : පැය දෙකයි
Time : Two hours

❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 06 කට පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.
    i. අපේ ජාතික වීරයෝ
    ii. අප ගිය අධ්‍යාපන චාරිකාව
    iii. විපතට පත්වූවන්ට පිහිට වෙමු.
    iv. කියවීමෙන් මිනිසා සම්පූර්ණ වේ.
    v. ගොවිකමේ අගය

(ලකුණු 25)

02. (අ) දීර්ඝ ස්වර ලියා දක්වන්න. (ලකුණු 05)

(ආ) අල්පප්‍රාණ සහ මහාප්‍රාණ අක්ෂර ලියා දක්වන්න. (ලකුණු 05)

(ඇ) නිවැරදි පිළිතුර තෝරා ලියන්න. "ෂ , ශ , ස "
    i. තාලුජ , මූර්ධජ , දන්තජ
    ii. දන්තජ , තාලුජ , මූර්ධජ
    iii. මූර්ධජ , තාලුජ , දන්තජ

(ලකුණු 05)

03. (අ) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.
    i. ඖෂධ , ඖෂධ , ඖෂධ
    ii. සංවර්ධනය , සන්වර්ධනය , සංවර්දනය
    iii. සංශෝදනය , සංසෝධනය , සංශෝධනය
    iv. ආත්මාර්තය , ආත්මාර්ථ්‍ය , ආත්මාර්ථය
    v. කොන්ඩඤ්ඤ , කොණ්ඩඤ්ඤ , කොණ්ඩඤ්ඥ (ලකුණු 05)

(ආ) උපසර්ග යෙදුණු වචන තෝරන්න.
**පින්තූර , පිළිගනී , පංහිඳ , දුදන , ඉම්හිරි** (ලකුණු 05)

(ඇ) පහත සඳහන් වචනවල ස්වර ව්‍යඤ්ජන වෙන් කොට දක්වන්න.
**පූර්වාදර්ශය , පරිච්ඡේදය , බෝධිමළුව , මෝහාන්ධකාරය , නොදියුණු**

(ලකුණු 05)

04. (අ) පහත සඳහන් හිස්තැන්වලට අදාළ ඒකවචන, බහුවචන ක්‍රියාරූප දක්වන්න.

| ඒකවචන | බහුවචන |
|---|---|
| ගියෙමි | ................................................ |
| ................................................ | යති |
| ගියෙහි | ................................................ |
| කන්නේ ය | ................................................ |
| ................................................ | යමු |

(ලකුණු 05)

(ආ) පහත සඳහන් වාක්‍ය බහුවචනයට නගන්න.

i. ළමයා ගීයක් ගැයුවේ ය.
ii. ගොවියා කුඹුර කොටයි.
iii. මව දරුවා නැළවූවා ය.
iv. මම පින්තූරය තේරුවෙමි.
v. රජු රට රකියි.

(ලකුණු 05)

(ඇ) පහත සඳහන් හිස්තැන්වලට අදාළ ක්‍රියා පද යොදන්න.

| විධි ක්‍රියා | පූර්ව ක්‍රියා | මිශ්‍ර ක්‍රියා |
|---|---|---|
| එන්න | .................................... | .................................... |
| .................................... | කියා | .................................... |
| .................................... | .................................... | නටමින් |
| බලන්න. | .................................... | .................................... |
| .................................... | .................................... | හඬලමින් |

The National e-learning Portal The General Education

(ලකුණු 05)

05. (අ) පහත සඳහන් පදවලට බහ්වර්ථ පද 03 බැගින් ලියන්න.

i. මව ii. අත iii. ජලය iv. සඳ v. පොළොව

(ලකුණු 05)

(ආ) පහත සඳහන් පදවලට විරුද්ධ පද ලියන්න.

i. බාල
ii. උඩුකුරු
iii. ඉදිරිපස
iv. පෙනෙන
v. අභ්‍යන්තර

(ලකුණු 05)

(ඇ) සුදුසු ආඛ්‍යාත පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. මම හොඳින් අකුරු ............................................................................ .

ii. අපි හොඳ ළමයි ................................................................................. .

iii. අම්මා උදෑසන අවදි වී ආහාර ...................................................................... .

iv. දෙවිවරු බුදුවීම සඳහා බෝසතුන්ට ඇරයුම් ................................................... .

v. උපාසිකාවෝ සිල් සමාදන් ....................................................................... .

(ලකුණු 05)

06. (අ) සුභාෂිතයේ ඔබ පාඩම් කළ කවි අතරින් කැමති කවි 02 ක් කට පාඩමෙන් ලියන්න. (ලකුණු 10)

(ආ) පහත සඳහන් කවිය සම්පූර්ණ කරන්න.

"අවන පටන් අඃ වන්නට වදතින් "

..................................................................................

..................................................................................

..................................................................................

(ලකුණු 05)

07. i. රෝහිණී නවකතාවේ රචකයා කවුද?

ii. රෝහිණී නවකතාවට පසුබිම් වූ කතා පුවත අප රටේ ශ්‍රේෂ්ඨ සිංහල රජ කෙනෙකුගේ කාලවකවානුවකට අයිතිය. එම සිංහල රජතුමා කවුද?

iii. ඉහත සඳහන් සිංහල රජතුමා අතින් පරාජයට පත් වූ රජුගේ නම කුමක්ද?

iv. නන්දිමිත්‍ර , වේළුසුමන , මිත්‍ර මොවුන් හඳුන්වන්න.

v. රෝහණ රාජධානිය ලංකාවේ කිනම් පළාතක තිබූ රාජධානියක්ද?

(ලකුණු 15)

08. කථාමෘතයේ මෙතෙක් ඉගෙන ගත් කතා ඇසුරින් අපට ගත හැකි ආදර්ශ මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2014

# Primary Piriven Year End Term Test - 2014

2 වසර / Grade 2

**සිංහල**
**Sinhala**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 06 කට පිළිතුරු ලියන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු වාක්‍ය රචනයක් ලියන්න.

   i. මහින්දාගමනය
   ii. පුරාවස්තු ආරක්ෂා කරමු
   iii. වන සත්ව සම්පත සුරකිමු
   iv. මිතුරන් සමඟ දූපතක ගත කළ රාත්‍රියක්
   v. ඉගෙනීමෙන් හික්මීම ලැබේ

(ලකුණු 25)

02. (අ) සඤ්ඤක අකුරු සහ නාසික්‍ය අකුරු වෙන වෙන ම පිළිවෙළින් ලියන්න. (ලකුණු 05)

   (ආ) මූර්ධජ අකුරු ලියා දක්වන්න. (ලකුණු 05)

   (ඇ) රකාරාංශය , කොම්බු දෙක , දීර්ඝ පාපිල්ල , යංශය , රේඵය යෙදෙන වචනය බැගින් ලියන්න. (ලකුණු 05)

03. (අ) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

   i. ප්‍රශ්ණ / ප්‍රශ්න / ප්‍රෂ්න
   ii. කොට්ඨාසය / කොට්ඨාශය / කොට්ටාසය
   iii. පරිසනක / පරිගණක / පරිසණක
   iv. ප්‍රස්තාවනාව / ප්‍රශ්තාවනාව / ප්‍රස්ථාවනාව
   v. මර්ධනය / මර්දනය / මර්දණය

(ලකුණු 05)

   (ආ) පහත සඳහන් වචන අකාරාදී පිළිවෙළට ලියන්න.

   ගස් , මල් , කොළ , ගෙඩි , දළු , පොතු , අතු , ඉති , නටු

(ලකුණු 05)

   (ඇ) පහත සඳහන් පද වලට සමානාර්ථ පද දෙක බැගින් ලියන්න.

   වනය , අලංකාර , ආදරය , දාසයා , උදය (ලකුණු 05)

04. (අ) "මිතුරු" ශබ්දය සියලු විභක්තිවල වරනගන්න. (ලකුණු 05)

(ආ) පහත සඳහන් සර්වනාම පද යොදා වාක්‍ය සාදන්න.

**ඈ , මෙතෙම , තෝ , උන්වහන්සේ , එය** (ලකුණු 05)

(ඇ) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.

**අඳුර , කැමති , අහස , විනීත , උගත්** (ලකුණු 05)

05. (අ) උපසර්ග යන්න කෙටියෙන් හඳුන්වා, උපසර්ග සහිත නාමපද 05 ක් සහ ක්‍රියාපද 05 ක් ලියන්න. (ලකුණු 05)

(ආ) නිපාත පද යෙදෙන අර්ථ 05 ක් දක්වා, ඒවාට නිදසුන් එක බැගින් ලියන්න. (ලකුණු 05)

(ඇ) පහත සඳහන් විරාම ලක්ෂණ යොදා අර්ථවත් වාක්‍ය සාදන්න.

. / ; / ( ) / " " / , (ලකුණු 05)

06. "රෝහිණී" නවකථාවට ඔබ ප්‍රිය කරන්නේ මන්ද යැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 15)

07. "සුභාෂිතය" සර්වකාලීන අගයකින් යුත් උපදේශ කාව්‍යයකි." නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

08. කතාමෘතයේ ඔබ සිත් ගත් කතාවක් කෙටියෙන් ලියා, එයින් ගත හැකි ආදර්ශය පැහැදිලි කරන්න. (ලකුණු 15)